# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 40/7 — 1973 ජනවාරි 03 වැනි බදාදා — 1973.01.03

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකා ජනරජයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට බටහිර වාරිකාවේ හලාවත සහ පුත්තලම මහේස්ත්‍රාත් වරුන්ගේ කොට්ඨාශ සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1973 ක්වූ ජනවාරි මස 10 වන දින පෙරවරු 10.00 ට මීගමුවේ අධිකරණ ශාලාවේදී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටව් නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දනුම් දෙමි.

ආර්. කේ. චන්ද්‍රානන්ද ද සිල්වා,
වයඹ පළාතේ පිස්කල්.

වර්ෂ 1972 ක්වූ දෙසැම්බර් මස 29 වන දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.
1—321


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

1 A—කේ 18603—5,500 (72/12)